# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1999/31 - 2016 දෙසැම්බර් මස 28 වැනි බදාදා - 2016.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 104/44

**(87 වැනි අධිකාරය වූ) භාර ආඥාපනත**

114 වැනි වගන්තිය යටතේ නියමය

''මාවිඩ්පුරම් පොන් භාරයේ'' භාරකරුවන්, එනම් -

1. සංගරපිල්ලේ නාගේන්ද්‍රන්,
2. සංගරපිල්ලේ මනෝහරන්,
3. ජෙරමිආ තිරුච්චන්ද්‍රන්,

විසින්, (87 වැනි අධිකාරය වූ) භාර ආඥාපනතේ 114 වැනි වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබීම සඳහා අධිකරණ අමාත්‍යවරයා වෙත ඉල්ලුම්කර ඇති හෙයින් ;

ඉහත කී ආඥාපනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මම, එකී භාරකරුවන් සංස්ථාගත කිරීමට මේ නියමයෙන් බලය දෙන අතර -

(අ) ඉහත කී භාරයේ රීති යටතේ සහ කොළඹ, ප්‍රසිද්ධ නොතාරිස්, කන්දයියා නීලකන්දන් විසින් සහතික කරන ලද 2012 ඔක්තෝම්බර් මස 6 වැනි දින, අංක 2086 දරන ඉහත භාර ප්‍රකාශනය යටතේ යථා පරිදි පත් කරන ලද ඉහත නම් සඳහන් එකී භාරයේ භාරකරුවන් සහ ඔවුන්ගේ තත්කාලීන අනුප්‍රාප්තිකයන් ''මාවිඩ්පුරම් පොන් භාරය'' යන නාමය සහ අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු යයි ද ;

(ආ) එකී භාරකරුවන් විසින්, එකී නාමය සහ අභිධානය, යටතේ චංචල හෝ නිශ්චල දේපළ එකී භාරය වෙනුවෙන් මිලදී ගැනීම, භාර ගැනීම, දැරීම, ණයට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි යයි ද ; සහ

(ඇ) එකී භාරයට අදාළව පැන නගින සියලු නඩු නිමිති වලදී ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර හෝ අධිකරණයක දී එකී නාමයෙන් සහ අභිධානයෙන් එකී භාරකරුවන් විසින් නඩු පැවරීමට සහ පවරනු ලැබීමට ද, උත්තර දීමට සහ උත්තර දෙනු ලැබීමට ද, විත්තිවාචක ඉදිරිපත් කිරීමට සහ විත්තිවාචක ඉදිරිපත් කරනු ලැබීමට ද නීතියෙහි ලා හැකියාව හා බලය ඇත්තේ යයි ද,

විධාන කර ප්‍රකාශ කරමි.

මේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම, නැතහොත් අවශ්‍ය යයි ද මට පෙනී යන ආකාරයකින් එය කලින් කළ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම, මා විසින් කරනු ලැබිය හැකි ය.

විජයදාස රාජපක්ෂ,
අධිකරණ අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

01 - 289